8 සත්ත්ව පාලනය

සත්ත්ව පාලනයේ වැදගත්කම

සත්ත්ව වර්ගීකරණය

H.K.S.P.Kumarasinghe
(BASc.Sp (Animal Science)
R/Egoda Waleboda Vidylaya
R/Samanpura Siddhartha Vidyalaya

සත්ත්ව පාලනයේ වැදගත්කම

- ප්‍රෝටීන ප්‍රභවයක් ලෙස යොදාගත හැකි වීම.
- රැකියා සැපයිය හැකි වීම.
- සත්ත්ව නිවාසවල ඉතිරුණු මලපහ ආදිය උසස් තත්ත්වයේ කාබනික පොහොරක් ලෙස භාවිත කළ හැකි වීම.
- කෘෂි බෝග වගාව සිදු කළ නොහැකි භූමි සත්ත්ව පාලනයට යොදාගත හැකි බැවින් එවැනි භූමි ප්‍රදේශ වලින් ප්‍රයෝජන ගත හැකි වීම.

- ජීව වායු නිෂ්පාදනයට.
- පවුලේ පෝෂණයට හා අමතර ආදායමක් ලබාගැනීමට අවස්ථාව සැලසීම.
- කෘෂි කාර්මික අතුරුඵල සත්ත්ව ආහාර ලෙස යොදා ගැනීමට හැකිවීම.
- සත්ත්ව පාලනයේ අතුරුඵල වන ඇට, කුර, හම් ආදිය කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලෙස යොදාගත හැකි වීම.

ශ්‍රී ලංකාවේ සත්ව පාලනයේ වර්තමාන තත්වය



ශ්‍රී ලංකාව තුළ සත්ත්ව පාලනය දියුණු කිරීමට පවතින විභව

ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප

තෙත් කලාපය = > වාර්ෂික වර්ෂාපතනය මි.මි. 2500

අතරමැදි කලාපය = වාර්ෂික වර්ෂාපතනය මි.මි. 1750 - 2500

වියළි කලාපය = < වාර්ෂික වර්ෂාපතනය මි.මි. 1750



රජයේ
පශු වෛද්‍ය කාර්යාලය
බුත්තල.

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව
கால்நடை உற்பத்தி, சுகாதாரத திணைக்களம் - இலங்கை
Department of Animal Production & Health - Sri Lanka

YOGURT

MILK
MILK
MILK
MILK

ගොවිපොළ සතුන් තේරීම

සත්ත්ව වර්ගීකරණය

- සම්භවය
- ප්‍රයෝජනය අනුව

ගවයින් වර්ගීකරණය

එළ ගවයන් සම්භවය වූ රට අනුව

යුරෝපීය ගව වර්ග

ඉන්දිය ගව වර්ග

ඉන්දීය ගව වර්ග (*Bos indicus*)	යුරෝපීය ගව වර්ග (*Bos taurus*)
• ඉන්දීය සම්භවයක් සහිත ය.	• යුරෝපීය සම්භවයක් සහිත ය.
• පරිසරයේ වැඩි උෂ්ණත්ව වලට ඔරොත්තු දේ.	• වැඩි උෂ්ණත්වයට ඔරොත්තු නොදේ.
• ශරීරය සාපේක්ෂව කුඩා ය.	• ශරීරය සාපේක්ෂව විශාල ය.
• මොල්ලිය මනාව වර්ධනය වී ඇත.	• මොල්ලිය මනාව වර්ධනය වී නැත.
• තැල්ල, පෙකණි පෙත්ත මනාව වර්ධනය වී ඇත.	• තැල්ල, පෙකණි පෙත්ත මනාව වර්ධනය වී නැත.
• ශරීරය පිටුපස රවුම් ය.	• ශරීරයේ පිටුපස රවුම් නැත.
• ශ්වේද ග්‍රන්ථි වැඩි ය.	• ශ්වේද ග්‍රන්ථි අඩු ය.
• හම ඇදෙන සුළුය. සෙලවේ.	• හම ඇගට තදවී ඇත.
• කිණිතුළු උණට හා බාහිර පරපෝෂිතයන්ට ඔරොත්තු දේ.	• කිණිතුළු උණට හා බාහිර පරපෝෂිතයන්ට ඔරෝත්තු නොදේ.
• පිරිමි සතුන් බර ඇදීමට සුදුසු ය.	• පිරිමි සතුන් අභිජනන කාර්යයන්ට යෝග්‍ය ය.
• කිරි නිෂ්පාදනය අඩු ය.	• කිරි නිෂ්පාදනය වැඩි ය.
• ලෝම කෙටි ය.	• ලෝම දිග ය.


මොල්ලිය
තැල්ල
පෙකණි පෙත්ත

යුරෝපීය ගව වර්ග

ඉන්දීය ගව වර්ග



එළ ගවයින්ගෙන් ලබාගන්නා ප්‍රයෝජන අනුව

- කිරි ලබා ගැනීම සඳහා

- මස් ලබා ගැනීම සඳහා

- ශ්‍රමය / බර වැඩ සඳහා

කිලාරි

කාන්ගායම්



තර්පකාර්

ෆ්‍රීෂියන් (Friesian)

- ඉහළ ම කිරි නිෂ්පාදනයක් (6000l - 7000l)
- සම්භවය නෙදර්ලන්තයයි
- ශරීරය සුදු පුල්ලි සහිතයි
- අං දිග ය
- ශරීර ප්‍රමාණය විශාල ය
- මේද ප්‍රතිශතය 3.5 - 4.0 %
- ලංකාවේ උඩරට තෙත් කලාපයට වඩාත් යෝග්‍ය ය
- දේශීය ගවයින් හා අභිජනනය කිරීමෙන් උසස් දෙමුහුම් සතුන් ලබා ගත හැකිය

අයර්ෂයර්

- නිපදවන කිරි ප්‍රමාණය (4500l - 6000l)
- සම්භවය බ්‍රිතාන්‍යයේ අයර්ෂයර්
- රතු හෝ දුඹුරු පුල්ලි සහිත සුදු පැහැති ශරීරයකින් යුක්තය
- නමුත් තද දුඹුරු හෝ සුදු පැහැති ගවයන්ද ඇත
- අං දිග ය.
- මේද ප්‍රතිශතය 4.0 % ක්
- ලංකාවේ උඩරට තෙත් කලාපයට වඩාත් යෝග්‍ය ය

ජර්සි (Jersey)

- යුරෝපය අවට ජර්සි දූපත
- ශරීර වර්ණය දුඹුරු හෝ තඹ හෝ අළු පැහැති විය හැකි ය.
- හොම්බ කලු පාට ය.
- ශරීරය ප්‍රමාණයෙන් කුඩා ය.
- මෙම සතුන්ගේ අං උල් වී ඉදිරියට නැමී ඇත.
- ඇස ඉදිරියට නෙරා ඇත
- නිපදවන කිරි ප්‍රමාණය 4000l - 4500l
- අඩංගු මේද ප්‍රතිශතය 4.5% - 5.4 %

සහිවාල් (Sahiwal)

- පකිස්ථානයේ සම්භවය
- කිරි ලබා ගැනීම
- විශාල ශරීරයකින් යුක්ත වීම
- ශරීර වර්ණය ලා දුඹුරු
- නිපදවන කිරි ප්‍රමාණය 2000l 2500l
- මේද ප්‍රතිශතය 4.5%
- මොල්ලියක් හා එල්ලා වැටෙන තැල්ලක් ඇත
- වියලි කලාපයේ ද මැදරට හා පහතරට වියළි කලාපයට යෝග්‍ය ය

රතු සින්දි(Red Sindhi)

- පකිස්ථානයේ කරච්චි
- ද්විකාර්ය වේ (කිරි හා ශ්‍රමය සඳහා)
- ශරීර වර්ණය රතු හෝ දුඹුරු පැහැති ය
- නිපදවන කිරි ප්‍රමාණය 2000l
- මේද ප්‍රතිශතය 4.5% - 5.0
- මොල්ලිය විශාල ය
- පාර්ශවික ව දිගුවක් වූ අං ඇත

දේශීය ගව වර්ගය

- වියලි කලාපයේ ස්වභාවික තෘණ භූමි වලය.
- ශරීර වර්ණය කළු හෝ රතු වේ. සුදු පැහැති පුල්ලි දක්නට ඇත.
- එක් මුරයකදී කිරි ලිටර් 600 - 700 ක් පමණ ගත හැකිය
- කිරි හා මස් ලබා ගැනීමට මෙන්ම බර ඇදීම සී සෑම ආදී කටයුතු සඳහා ද යෝග්‍ය ය .
- උසස් ගව වර්ග සමග දෙමුහුම් කිරීමෙන් දේශීය සතුන් වැඩි දියුණු කළ හැකිය

Thank You
Contact through
sajeeee89@gmail.com